SLGURU.LK

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025

ශ්‍රේණිය Grade	12	විෂයය Subject	පෙරදිග සංගීතය - 1 කොටස	කාලය Time	පැය 02
නම பெயர் Name					

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුයි.**

1. සරි ,සගගම, සගරිගම යන ස්වර අභ්‍යාසයේ අවරෝහණයේ ආරම්භක අවස්ථාව තෝරන්න.
   I. ඝ්නි , ඝ්නිධප , ඝ්නිධපම
   II. ඝ්නි, ඝ්ධධප, ඝ්ධනිධප
   III. ඝ්නි, ඝ්ධනිධ , ඝ්ධනිධප
   IV. ඝ්නි , ඝ්නිනිධ, ඝ්ධනිධප
   V. ඝ්නි ,ඝ්ධධප, ඝ්නිධපම

   (.....)

2. රාගයක සංවාදී ස්වරය පිහිටන්නේ වාදී ස්වරයේ සිට කුමන ස්වරය සමග ද?
   I. හතරවන හෝ පස්වන ස්වරය මතය.
   II. දෙවන හෝ තුන්වන ස්වරය මතය.
   III. තුන්වන හෝ හතරවන ස්වරය මතය.
   IV. පළමුවන හෝ දෙවන ස්වරය මතය
   V. පස්වන හෝ තුන්වන ස්වරය මතය.

   (.....)

3. "වයලින් , එස්රාජ්" සහ " සිතාර් , සරෝද්" යන සංගීත භාණ්ඩ වාදනයේදී එක් ස්වරයක සිට තවත් ස්වරයක් දක්වා හඬ නොකඩවා පවත්වා ගෙන යාම පිළිවෙලින් හඳුන්වනුනේ,
   I. මීන්ඩ් - ජෝඩ් යනුවෙනි
   II. ආන්දෝලන -ජෝඩ් යනුවෙනි
   III. සූත් - මීන්ඩ් යනුවෙනි
   IV. මීන්ඩ් - සූත් යනුවෙනි
   V. සූත් - ආන්දෝලන යනුවෙනි

   (.....)

4. තබ්ලාවේ වාදනය වන කායදා ,රේලා ආදී පද තුළ කෙරෙන විස්තාරයන් හඳුන්වනු ලබන නම කුමක් ද
   I. තිහායි යනුවෙනි.
   II. මුබඩා යනුවෙනි.
   III. පල්ටා යනුවෙනි.
   IV. චක්‍රධාර් යනුවෙනි.
   V. පරන් යනුවෙනි.

   (.....)

5. රාගාශ්‍රිත පදනමක් සහිත ගීත රසාස්වාදනය සඳහා උපකාරි වන සාධකය කුමක් ද?
   I. ගායන ශිල්පියා පිළිබඳ තොරතුරු
   II. පදමාලාව පිළිබඳ දැනුම සහ තාලාවබෝධය
   III. වාදක මණ්ඩලය පිළිබඳ තොරතුරු
   IV. වයනු ලබන භාණ්ඩ පිළිබඳ දැනුම
   V. තනු නිර්මාණය සඳහා පාදක වී ඇති ස්වර , තාල, හා ගී පදමාලාව (.....)

6. දේස් රාගයේ ජාතිය කුමක් ද?
   I. සම්පූර්ණ වේ.
   II. ෂාඩව වේ.
   III. ඔෂධව වේ.
   IV. ඔෂධව-ෂාඩව වේ.
   V. ෂාඩව-සම්පූර්ණ වේ (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

7. සම ප්‍රකෘති රාග යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
   I. භාගේශ්‍රී- දේස්
   II. දේස්- තිලක්කාමෝද්
   III. තිලක්කාමෝද්-භාගේශ්‍රී
   IV. දේස්- මාල්කෞන්ස්
   V. මාල්කෞන්ස්-තිලක්කාමෝද්

(.....)

8. භාගේශ්‍රී රාගයෙහි පංචමය ස්වරය යොදා ගනු ලබන්නේ,
   I. අනුවාදි ස්වරයක් ලෙසය.
   II. අද්ව දර්ශක ස්වරයක් ලෙසය.
   III. ආගන්තුක ස්වරයක් ලෙසය.
   IV. සංවාදි ස්වරයක් ලෙසය
   V. වාදි ස්වරයක් ලෙසය.

(.....)

9. අද්ව දර්ශක (සමය දර්ශක) ස්වරය පදනම් කර ගනිමින් හඳුන්වනු ලබන රාග වර්ගය තෝරන්න.
   I. පූර්වාංගවාදී රාග
   II. සන්ධි ප්‍රකාශ රාග
   III. පරමේල ප්‍රවේශික රාග
   IV. සම ප්‍රකෘති රාග
   V. උත්තරාංග වාදී රාග

(.....)

10. ශාස්ත්‍රීය තබ්ලා වාදනයක් සඳහා වාදන අංගයක් ලෙස වැයෙන ස්වර ප්‍රබන්ධය හඳුන්වන්නේ,
   I. උපජ් නමින්ය.
   II. සූත් නමින්ය.
   III. ලෙහෙරා නමින්ය.
   IV. ජෝඩ් නමින්ය.
   V. ගත් නමින්ය.

(.....)

11. නව ග්‍රහයින් උදෙසා පවත්වනු ලබන ශාන්ති කර්මය තෝරන්න.
   I. ගම්මඩු
   II. සූනියම් යාගය
   III. දිය කොරහෙ බලි
   IV. දෙවොල් මඩු
   V. මහ සොහොන් සමයම

(.....)

12. පහත සඳහන් ශාන්ති කර්ම ගී පාද අතරින් සදැස්මත් ගණන 24 ක් වන , මැදුම් තනි තිත අනුව ගැයෙන ගී පාදය තෝරන්න.
   I. ගුණ දැනේ බෝසත් අනේ පෙර ඉපදුනේ ගිරවකු මෙනේ.
   II. සුද්දෝදන රජුට දාව උපන් එ නරවර.
   III. නිරිත කොන යුතා මල්මල් සුවඳැති වැටකෙ වන වෙතා.
   IV. සුරතට රැගෙන පන්දම් යාගෙට ඇදුරා.
   V. ආල වඩන ගන්ධ කුටියෙ මුනි වැඩ සිට ගෙන. (.....)

- අංක 13 සිට 15 දක්වා ප්‍රශ්න වලට පිලිතුරු සඳහා පහත ස්වර ප්‍රස්තාරය ඇසුරු කර ගන්න.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14
ම රි	-	මප	(නි)	-	ධ	ප	මග	රිග	ස	රි	-	ම	ප
X			2				0			3			

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

13. "ඛන්" ස්වරය පෙන්නුම් කෙරෙන විභාගය වන්නේ.

I. පළමු විභාගයයි.
II. දෙවන විභාගයයි.
III. තුන් වන විභාගයයි.
IV. සිව්වන විභාගයයි.
V. තුන් වන සහ සිව්වන විභාගයයි

(.....)

14. "මූර්කි" පෙන්නුම් කෙරෙන ස්වරය ඇතුලත් විභාගය තෝරන්න.

I. පළමු විභාගයයි
II. දෙවන විභාගයයි.
III. තුන් වන විභාගයයි.
IV. සිව්වන විභාගයයි.
V. පළමු සහ සිව්වන විභාගයයි

(.....)

15. "වක්‍ර ස්වරය සහ මීන්ඩ්" පෙන්නුම් කෙරෙන විභාග දෙක නම් කරන්න.

I. පළමු හා දෙවන විභාග
II. පළමු හා තුන්වන විභාග
III. දෙවන හා තුන්වන විභාග
IV. තුන්වන හා සිව්වන විභාග
V. පළමු හා සිව්වන විභාග

(.....)

16. "සංගීත සම්භව" සහ "සංගීත සංහිතා" යන ග්‍රන්ථ දෙක රචනා කල ගත් කතුවරුන් දෙදෙනාගේ නම් පිළිවෙළින් සදහන් වරණය තෝරන්න.

I. ආනන්ද ජයසිංහ මහතා සහ විමල් අභයසුන්දර මහතා
II. විමල් අභයසුන්දර මහතා සහ ඩබ්. බී. මකුලොලුව මහතා
III. සී.ද එස්. කුලතිලක මහතා සහ විමල් අභයසුන්දර මහතා
IV. වින්සන්ට් සෝමපාල මහතා සහ විමල් අභයසුන්දර මහතා
V. සී.ද එස්. කුලතිලක මහතා සහ වින්සන්ට් සෝමපාල මහතා (.....)

17. "ගීතං වාද්‍යං තථා නෘත්‍යං- ත්‍රයං සංගීත මුච්‍යතේ" යන ශ්ලෝකය සදහන්ව ඇති ග්‍රන්ථයේ නම ඇතුළත් වරණය තෝරන්න.

I. සංගීත පරිජාත
II. බෘහත්දේසි
III. ක්‍රමික පුස්තක් මාලිකා
IV. නාට්‍ය ශාස්ත්‍රය
V. සංගීත රත්නාකරය

(.....)

18. ශ්‍රී ලංකාවේ ප්‍රථම නාඩගම ලෙස සැලකෙන "හරිස්චන්ද්‍ර" නාඩගම සදහා දායක වූ සංගීතඥයා කවු ද?

I. ගණිතාලංකාර
II. අලගනායිදු
III. නරසිංහ
IV. නාරායන් අයියර්
V. විශ්වනාත් ලෞජී

(.....)

19. නූර්ති සංගීතය සදහා පමණක් සුවිශේෂි වූ කරුණු ඇතුළත් වරණය තෝරන්න.

I. දොහොරාව, උරුට්ටුව
II. පොතේ විරිදුව,තර්ගය
III. ස්ථායි , අන්තරා
IV. මද්දලය , තබ්ලාව
V. අලගනායිදු ,ජඨා ශංකර්

(.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

20. පූර්ව රංගය සහ අපර රංගය යනුවෙන් රංග අවස්ථා දෙකක් යොදා ගෙන ඇති දේශීය රංග සම්ප්‍රදාය සහ ඊට අදාළ චරිතය තුමක් ද?

I. කෝලම්-මුදලි
II. නාඩගම්- ජසයා
III. නූර්ති- බහුබූතයා
IV. කෝලම්-සෙල්ලන් ළමා
V. නාඩගම්- සූත්‍රධාරි

21. සොකර්,කෝලම්,නාඩගම් සහ නූර්ති යන රංග ශෛලීන් වලට තාල වාදනය සඳහා යොදා ගනු ලැබූ අවනද්ධ භාණ්ඩ පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

I. ගැටබෙරය,තබ්ලාව, පහතරට බෙරය, මද්දලය
II. ගැටබෙරය,පහතරට බෙරය, මද්දලය,තබ්ලාව
III. පහතරට බෙරය, ගැට බෙරය,මද්දලය,තබ්ලාව
IV. තබ්ලාව, මද්දලය, ගැට බෙරය, පහතරට බෙරය
V. මද්දලය, පහතරට බෙරය,ගැට බෙරය , තබ්ලාව

(.....)

22. "ලකල පරසිදු ,කතරගම පුර කදිර සුරිදුගෙ පාද නමදිමු" ගී පාදය ගායනයට සුදුසු තාල රටාව තෝරන්න.

I. 1 2 3 / 1 2 3 4/
II. 1 2 3 / 1 2 3 / 1 2 3 4/
III. 1 2 3 / 1 2 3 4 / 1 2 3 4 /
IV. 1 2 / 1 2 / 1 2 3 /
V. 1 2 / 1 2 3 / 1 2 3 4 /

(.....)

23. "නංගිට බැදපු මල් වියනයි" මෙම සරල ගීතය නිර්මාණයට පදනම් වූ ගීත විශේෂය කුමක් ද?

I. කපිරිඤ්ඤා ගීත
II. ග්‍රැමෆෝන් ගීත
III. චිත්‍රපට ගීත
IV. වැදි ගීත
V. කණ්ඩායම් ගීත

(.....)

24. රාගධාරී ශාස්ත්‍රීය ගායනයේ දී ශ්‍රැති වාදනය සඳහා යොදා ගනු ලබන සංගීත භාණ්ඩයකි.

I. සාරංගි
II. සන්තූර්
III. දිල්රුබා
IV. ස්වර මණ්ඩල්
V. ෂෙනායි

(.....)

25. උත්තර භාරතීය සංගීතයේ ගාන සමය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. යම් රාගයක් අයත් වන ජාතිය ආශ්‍රයෙන් එම රාගයේ ගාන සමය හඳුනා ගත හැකි වේ.
II. යම් රාගයක වාදී ස්වරය උත්තරාංගයේ පිහිටියේ නම් එම රාගයේ ගාන සමය රාත්‍රී 12 සිට දිවා 12 දක්වා යෙදෙන කිසියම් ප්‍රහරයකට අයත් වේ.
III. රාත්‍රී කාලයේ කෝමල ස්වර යෙදෙන රාග පමණක් ගායනය හෝ වාදනය කිරීමට සුදුසු වේ.
IV. දහවල් කාලය ශුද්ධ ස්වර සහිත රාග ගායනය ඉතා සුදුසු වේ.
V. කෝමළ ග .ධ .නි . යෙදෙන රාග කුමන අවස්ථාවක දී වුවද ගායනය හෝ වාදනය කල හැකි වේ.

(.....)

26. සංගීත අධ්‍යනය සඳහා පාසල් සිසුන් බහුලව භාවිතා කරන website එකක් වන්නේ.

I. Google
II. Yahoo
III. You tube
IV. MSN
V. URL

(.....)

27. නිවැරදි ඉරියව් මත පිහිටා ගායනය , වාදනය කිරීමෙන් මිනිස් සිරුර තුළ ඇතිවන ශක්ති ස්ථාන හඳුන්වන්නේ.

I. භාවය නමිනි.
II. ලෞකික නමිනි.
III. චක්‍ර නමිනි.
IV. විභව නමිනි.
V. අධ්‍යාත්මික නමිනි.

(.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

28. ශාස්ත්‍රීය සංගීතයේ දී තානාලංකාර නැමති ශිල්පීය ක්‍රමය භාවිතා නොවන ගීත විශේෂයක් වන්නේ,

I. සර්ගම් ගී
II. මධ්‍යලය ගී
III. විලම්භ ලය ගී
IV. දෘත ලය ගී
V. සරල ගී

(.....)

29. E G B යන ස්වර සංකලනය වී නිර්මාණය වන ස්වර සංඝාතය (CHORD) හඳුන්වන නාමය කුමකු ද?

I. E Major
II. E Minor
III. E Augmented
IV. E Diminished
V. E Suspended 4

(.....)

30. දේශීය තාල පද්ධතිය ගොඩ නැගීමේ දී අවනද්ධ තාල වාදනයට උචිත තිත් රූප ගණන කීය ද?

I. 06 කි
II. 07 කි
III. 08 කි
IV. 32 කි
V. 25 කි

(.....)

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්ණ වල ඇති හිස්තැන් සඳහා සුදුසුම පිළිතුර ලියන්න.**

31. තබිලාවෙන් වැයෙන " ධා තිරිකිට ධිං ධිං" යන යේකා කෙටස උත්පාදනය කිරීමට භාවිතා කරනු ලබන්නේ බායාවේ "ගෙ" සහ ..... යන අක්ෂරත් , දහිනාවේ තා, රි, ට , සහ ..... යන අක්ෂරත් වේ.

32. නිෂාදය දෙයාකාරයෙන් යෙදෙන නිර්දේශිත සම්පූර්ණ ජාති රාගය ..... වන අතර ඊට සම ප්‍රකෘති වන රාගයේ ජාතිය ..... වේ.

33. ගත් වාදනයක දී " රිම පනි ධප මප ස" යන ස්වර පාදය සමග්‍රහයේ සිට තුන් වරක් වාදනය වී නැවත සමග්‍රහයට පැමිණේ නම් එම තාලය වනුයේ ..... යි. ඉහත ස්වර ඛණ්ඩය යම් තාලයක තුන්වන මාත්‍රාවේ සිට තුන් වරක් වාදනය කිරීමෙන් සමග්‍රහයට පැමිණේ නම් එම තාලය වනුයේ ..... යි.

34. ත්‍රි තාල් ..... සහ ..... යන තාල තුන මිතියෙන් සමාන නමුත් ගතියෙන් වෙනස් වේ.

35. නිර්දේශිත රාග දෙකක් වන ..... රාගය සහ ..... රාගයෙන් ඛ්‍යාල් ගායනය සිදු කිරීමේ දී තාන්පුරාවේ තත් " ම ස ස ස" ලෙස සුසර කරනු ලැබේ.

36. ^ / ^ /
1 2 3 / 1 2 3 4 / 1 2 3 / 1 2 3 4 /මෙම තිත් රූපය ..... දෙතිතට අයත් වන අතර " ජී 0 / ජී මි කි ට / ත ත් / ත රි කි ට / යන බෙර පදය වාදනය කිරීමට සාම්ප්‍රදායිකව භාවිතා කරනු ලබන්නේ ..... නම් තාල වාද්‍ය භාණ්ඩයයි.

37. ලෝකයෙහි භාවිතා වන සංගීත පද්ධති පහක් හඳුනාගෙන ඇත, එනම් චීන , භාරතීය , ... , අපරදිග , සහ ..... වශයෙනි.

38. "සෝබමාන දේව පුරා , හෘදේ මාගෙ ශෝක බෝ වේ , මෝක්ෂාචාර්ය තිලෝනගෙ" යන ගීත ත්‍රිත්වය ඇතුළත් නූර්තියෙහි නම ..... වන අතර ,එහි නිශ්පාදකවරයා වන්නේ ..... ශූරීන් ය .

39. "අන්ද්‍ර ගුවන් හැර නැංග අසුන් පිට" යන ගී පාදය ..... සම්ප්‍රදායට අයත් ශාන්ති කර්ම ගීතයක් වන අතර " ගුණ දැනේ බෝසත් අනේ" ශාන්ති කර්ම ගී පාදය ..... සම්ප්‍රදායට අයත් වේ.

40. "හෝ පලු වන පෙත" ගීතය ..... ශූරීන් විසින් ගායනා කරනු ලබන අතර එම ගීතය ..... රාගය ආශ්‍රයෙන් නිර්මාණය කර ඇත.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

41. Interlude යනු සරල ගීතයක යෙදෙන ..... වන අතර , ගී පාද දෙකක් අතර සම්බන්ධතාවය ගොඩ නැගීම සඳහා භාවිතා කරන කෙටි ස්වර ඛණ්ඩය ..... නමින් හැඳින් වේ.
42. ගීතයක හෝ වාදිතයක ආරම්භයේ සිට සමස්ථානයට ප්‍රවිශ්ට වන තෙක් ගැයෙන / වැයෙන කොටස ..... නමින් හැඳින්වෙන අතර ස්වර කොටස් තෙවරක් ගායනා / වාදනය කර සමස්ථානයට පැමිණීම ..... නමින් හැඳින් වේ.
43. "විශ්ව විසින් තම වාද්‍ය භාණ්ඩයෙන් ශාස්ත්‍රීය වාදනයක අංගයක් වූ ගත් වාදනයක් සිදු කර තිහායි කොටසක් වාදනය අවසන් කරන ලදී . නාමලී විසින් එම වාදනයේ මුල සිට අවසානය දක්වා සාරංගියෙන් ගම ධනි ස - - නි ධ ම ගම ගස / වශයෙන් වූ ස්වර රචනාව නැවත නැවත වාදනය කරන ලදී.
- විශ්ව විසින් ..... නම් වාද්‍ය භාණ්ඩය වයන ලද අතර ඔහුගේ වාදනය සිදු කලේ නිර්දේශිත තාලයක් වන ..... තාලයට අනුවය.
44. නාමලී විසින් වයන ලද ස්වර රචනාවෙහි ශුද්ධ නිශාදය ස්වරය වෙනුවට කෝමල නිශාදය යෙදූ විට ..... නම් රාගය පිළිඹිබු වේ. එම රචනාව අනුව සමග්‍රහය පෙන්නුම් කිරීම සඳහා වඩාත්ම සුදුසු ස්වරය වන්නේ ..... ස්වරය යි.
45. විශ්ව විසින් වාදනය කල භාණ්ඩය ..... වාද්‍ය ගණයට ද, නාමලී විසින් වාදනය කල ස්වර රචනාව ..... ලෙස ද හඳුන්වයි.
46. රාගයක එකවර අත් නොහල යුතු ස්වර දෙක වන්නේ ..... ස්වරය සහ ..... ස්වරයයි.
47. තාලම්පට වාදනයේ දී නැගෙන ධ්වනීන් දෙකට අයත් සංකේත දෙක හඳුන්වන නාමයන් වන්නේ ..... සහ ..... ය.
48. උත්තර භාරතීය සංගීතයෙහි ගාන සමය පිළිබඳ විමසීමේ දී දිවා 12 සිට රාත්‍රී 12 දක්වා ගැයෙන රාග ..... රාග ලෙස ද , රාත්‍රී 12 සිට දිවා 12 දක්වා ගැයෙන රාග ..... රාග ලෙස ද හඳුන්වයි.
49. "වාසනා දිනේකි මේක" යන ගීතය තාල රූප දෙකකට අනුව ගැයේ . එනම් ..... තාලය සහ ..... තාලයයි.
50. විවිධ රට වල සංගීතය විවිධ වෙනස්කම් වලින් යුක්ත වීමට බලපෑ හේතු සාධක දෙකක් ලෙස ..... සහ ..... දැක්විය හැකිය.

(ලකුණු - 50 x 2 = 100)

SLGURU.LK
For Educational Purpose Only

“Education is the key to success in life.” — Solomon Ortiz

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ග

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025

ශ්‍රේණිය Grade	12	විෂයය Subject	පෙරදිග සංගීතය - 11 කොටස	කාලය Time	පැය 03
නම பெயர் Name					

සැලකිය යුතුයි.

1 කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, 11 කොටසින් **එක්** ප්‍රශ්නයකට ද , 111 කොටසින් ප්‍රශ්න **දෙකකට** ද,වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.)

1 කොටස

1) පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර සංගති කිහිපයකි.

A. ස ඍ ම , ම ඍ රි ස

B. ස රි , ප ම ග , ස ණි

C. ම ප , නි ධ ප ධ , ම ග රි , ග ස

i. ඉහත ස්වර සංගති අයත් වන රාග අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නම් කරන්න (ලකුණු 06)

ii. ඉහත නම් කළ රාග තුනට අදාළ "මේලය" සහ "ගාන සමය" රාග නාමයත් සමග ලියන්න. (ලකුණු 06)

iii. ඉහත රාග අතරින් රිෂභය සහ පංචමය වාදී සංවාදී වන රාගයට අදාළ මධ්‍යලය ගීතයේ හෝ වාදිතයේ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර මාත්‍රා 08 ක තානාලංකාර 02 ක් ලියන්න. (ලකුණු 08)

2) පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග කිහිපයකට අයත් මුඛ්‍යාංග කිහිපයකි.

A. ඳ ණි ස රි ග , ස , රි ප ම ග , ස ණි

B. ස නි ධ ස , ම ධ නි ධ , ම ග රි ස

C. රි ම ප , නි ධ ප , ප ධ ප ම , ග රි ග ස

i. ඉහත A ,B ,C අක්ෂර මගින් දැක්වෙන මුඛ්‍යාංග සඳහා අදාළ වන රාග නම් කරන්න. (ලකුණු 03)

ii. ඉහත රාග අතරින් "ජාතිය" පිලිබඳ මත සහිත රාගයට අදාළ මධ්‍යලය ගීතයේ හෝ වාදිතයේ අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කර මාත්‍රා 08 කින් යුතු තානාලංකාර 02 ක් ලියන්න. (ලකුණු 08)

iii. ඉහත රාග අතරින් සම ප්‍රකෘති රාග යුගලය නම් කර එම රාග දෙකෙහි අසමානතා දෙකක් රාග සංගති ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. ත්‍රිතාලයට ගැළපෙන පරිදි මාත්‍රා 16 න් යුත් කායදාවක් ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04)

3) පහත හිස්තැන් සහිත ස්වර පේළි තුන හොඳින් නිරීක්ෂණය කරන්න. ඉන් දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අදාළ අවරෝහණයේ ස්වරයන්හි අසම්පූර්ණ ස්වර පේළි තුනකි.

A. ස් ..... ධ ම ..... ම .... ස

B. ස් .... ප ..... ග රි ..... ස

C. ස් ..... ධ ම ..... , ... රි ග ස ..... ,

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

i. A ,B ,C හි දැක්වෙන හිස්තැන් වලට අදාළ ස්වර යොදා සම්පූර්ණ කර අදාළ රාගය ද ඉදිරියෙන් ලියන්න. (ලකුණු 06)

ii. ත්‍රී තාලයේ යේකාව තාල සංකේත සහිතව ප්‍රස්තාර කර එම ප්‍රස්තාරය යටතෙහි ඉහත 1 කොටස සඳහා ඔබ විසින් නම් කරන ලද රාග තුනෙන් කැමති රාගයක ආරෝහණයෙහි ස්වර පිළිවෙලින් යෙදෙන ආකාරයට එක් ආවර්ථයක් සම්පූර්ණ වන ලෙස අදාළ මාත්‍රා ඇදීම් සහිතව (යති / විශ්‍රාන්ති) ලියන්න. (ලකුණු 06)

iii. පහත සඳහන් ස්වර ප්‍රස්තාරය නිර්දේශිත රාග තුනක් ආශ්‍රයෙන් නිර්මාණය කර ඇත.

1 2 3 4
ම ප නි ස̣ / <u>නි</u> ධ - - / ම <u>ග</u> රි ස / ස රිග ස <u>ධ̣</u> /

5 6 7 8
රි ම ප ධ / ප මග රිග ස / ම ධ <u>නි</u> ධ / ම <u>ග</u> මග රිස /

ඉහත එක් එක් විභාගයට යොදා ඇති අංක ආශ්‍රයෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A. 1 සහ 2 විභාග එක් වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.
B. 2 සහ 3 විභාග එක් වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.
C. 4 සහ 5 විභාග එක් වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.
D. 5 සහ 6 විභාග එක් වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.
E. 7 සහ 8 විභාග එක් වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න. (ලකුණු 05)

iv. ජප් තාලයේ යේකාව නියමිත තාල සංකේත යොදා දෙගුණ ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

<u>11 කොටස</u>

4) .

i. ගැමි ගී සහ සේ ගී කරුණු තුනක් යටතේ සංසන්දනය කරන්න. (ලකුණු 06)

ii. උඩරට ශාන්ති කර්ම ගී සහ සබරගමු ශාන්ති කර්ම ගී පිළිබඳ කරුණු හතරක් මගින් සංසන්දනය කරන්න(ල 04)

iii. මෙරට සංගීතය පෝෂණය වීම සඳහා මහනුවර යුගයේ දී දක්නට තිබූ සංගීත නැටුම් ආයතන පහෙන් හතරක් නම් කරන්න. (ලකුණු 04)

iv. දේශීය තාල පද්ධතියේ තනි තිත සහ දෙතිතට අදාළ තිත් රූප ගොඩ නැගෙන ආකාරය මාත්‍රා සහ තිත් සළකුණු සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

5) .

i. පහත දක්වා ඇති කෝලම් රංග ශෛලිය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

- රංග ගත කල ස්ථානය
- ගී තනු වල ස්වභාවය
- යොදා ගත් සංගීත භාණ්ඩ

ii. නාඩගම් ගී හා සම්බන්ධ පහත සඳහන් අංග අතරින් දෙකක් පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න(ල. 04)

- තර්ගය
- තෝඩායම
- උරුට්ටුව
- ඉන්නිසය

iii. සොකරි සහ කෝලම් රංග ශෛලීන් දෙකෙහි සමානතා හතරක් සහ අසමානතා දෙකක් ලියන්න. (ලකුණු 06)

iv. නූර්ති සංගීතයේ දක්නට ලැබෙන සුවිශේෂි ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

111 කොටස

6)



i. මූලික ශ්‍රැති ස්වරය අපරදිග C ස්වරයට සමාන සේ සලකා ඉහත දක්වා ඇති අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න . (ලකුණු 08)

ii. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයේ 1,2,3,4,5,සහ 6 යන අංක වලට අයත් සංකේත නම් කරන්න. (ලකුණු 06)

iii. පහත සඳහන් අපරදිග ප්‍රස්තාරය තුල යොදා ගන්නා සංකේත දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- Time signature
- Cleff
- Short staff
- Great staff (ලකුණු 06)

7) .

i. තබ්ලාවක දල රූප සටහනක් ඇද එහි කොටස් හතරක් නම් කරන්න. (ලකුණු 06)

ii. පහත වගුවෙහි 1 සිට 4 දක්වා එක් එක් හිස්තැනට අදාළ පිළිතුර අදාළ අංකය සමග ලියන්න.

ගීතය	රාගය	ගායනය
හංස රාජිනි	1	සුනිල් එදිරිසිංහ
2.....	භාගේශ්‍රී	වික්ටර් රත්නායක
ගීතය	**ආශ්‍රිත රාගය**	**චිත්‍රපටය**
තු ගංගා කි මෝජ් මෛ	3.....	බෛජු බව්රා
තෙරේ මේරේ	බමාජ්	4.....

(ලකුණු 04)

iii. රාගාශ්‍රිත සරල ගීතයක දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 06)

iv. 11 ප්‍රශ්නයට අදාළ වගුවේ සටහන් ගීත වලට අමතරව ඔබ දන්නා වෙනත් රාගාශ්‍රිත සරල ගී දෙකක් සහ ඊට අදාළ වන රාග දෙකක් ලියන්න. (ලකුණු 04)

8) .

i. පහත පද රචනාවට උචිත තනුවක් නිර්දේශිත රාගයක් ආශ්‍රයකර ගනිමින් නිර්මාණය කර ගීත ස්වර ප්‍රස්තාර කරන්න.ආශ්‍රය කරගත් රාගයේ නම ද ලියන්න. (ලකුණු 08)

" නිල් අහස් උඩු වියන - කළු දුමින් වැසිලා"

ii. පහත සඳහන් A හෝ B යන එක් කොටසක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.

A. "ඩබ්ලිව් . බී. මකුලොලුව" ශූරීන් විසින් රචිත " හෙළ ගී මග" ග්‍රන්ථය පාසල් සංගීත අධ්‍යාපනයට දායක වී ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

B. සංගීත විශාරද වින්සන්ට් සෝමපාල ශූරීන් විසින් පාසල් සංගීත අධ්‍යාපනයට සිදු කල මෙහෙවර විස්තර කරන්න. (ලකුණු 04)

iii. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

- ගාන සමය
- ආලාප
- තරාණා
- තානාලංකාර

(ලකුණු 08)

SLGURU.LK
For Educational Purpose Only

“Education is the key to success in life.” — Solomon Ortiz

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.